# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

**අංක 11,727 — 1959 අප්‍රේල් 17 වැනි සිකුරාදා — 17.4.1959**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## III වැනි කොටස – ඉඩම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)


| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... | — |
| අවසාන නියෝග ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | 791 |

| | පිට |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම :— | |
| බස්නාහිර පළාත ... ... | — |
| මධ්‍යම පළාත ... ... | — |
| දකුණු පළාත ... ... | — |
| උතුරු පළාත ... ... | — |
| නැගෙනහිර පළාත ... ... | — |
| වයඹ පළාත ... ... | — |
| උතුරු මැද පළාත ... ... | — |
| ඌව පළාත ... ... | — |
| සබරගමු පළාත ... ... | 791 |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් ... | 792 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් ... | — |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් ... ... | 797 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම ... | — |


## ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම

### සබරගමු පළාත

**ඉලක්කම 14578.** ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1959යේ මැයි මස 30 වෙනි දින වූ සෙනසුරාදා පෙරවරු 9 ට බෙලිහුල්ඔය තානායමේදී විකිණීමට, බදුදීමට නොහොත් වෙන අන් දමකින් තීන්දු කරන්ට යෙදෙවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත කෝරලේ තලපිටගම් පත්තුවේ පිහිටා තිබෙන බිම් කැබලි එකොළහක්.

**ගම් සිතියමේ අංක 596—පුවක්ගහවල (කොටසක්)**

**කැබැල්ල : 205.**

ඉඩමේ නම : මාලිගාතැන්න ; අයිතිකම්කියන්නෝ : කුඹල්ගම පදිංචි කාරියප්පෙරුම මුදියන්සේලාගේ හීන් මැණිකෙ, කුඹල්ගම පදිංචි කාරියප්පෙරුම මුදියන්සේලාගේ මුතු මැණිකෙ සහ කාරියප් පෙරුම මුදියන්සේලාගේ කිරි මුදියන්සේගේ දරුවො. විස්තරය : හේන ; ප්‍රමාණය : අ. 0, රූ. 1 ප. 27.

**කැබැල්ල : 239.**

ඉඩමේ නම : හපුගහකුඹුරෙහේන ; විස්තරය : හේන ; අයිතිකම් කියන්නා : පඹහින්නේ පදිංචි අත්තනායක මොහොට්ටාලලාගේ කිරි බණ්ඩා ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 28.

**කැබැල්ල : 271.**

ඉඩමේ නම : තැන්නහේන ; විස්තරය : හේන ; අයිතිකම් කියන්නෝ : කඳුරුගමුවේ පදිංචි සොෆායා රොස්ලින් බිබිලෙ කුමාරිහාමි, බිබිලේ පදිංචි චූලරත්න බිබිලෙ, ප්‍රේමරත්න බිබිලෙ සහ ශ්‍රියානන්ද බිබිලෙ ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 00.

***කැබැල්ල : 1.**

ඉඩමේ නම : හෙනගහපුඇල්ලේවත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නා : ඕවිටිගල විතානගේ දොන් සියදෝරිස් අප්පුහාමි ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 18.

***කැබැල්ල : 6.**

ඉඩමේ නම : හිරලොච්ච වත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නා : බෑම්ටන් වතුයායේ තේ සමාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 2. ප. 00.

***කැබැල්ල : 9.**

ඉඩමේ නම : හිරලොච්ච වත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නා : බ්‍රම්ටන් වතුයායේ තේ සමාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 1. ප. 09.

***කැබැල්ල : 10.**

ඉඩමේ නම : හිරලොච්ච වත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නා : බ්‍රම්ටන් වතුයායේ තේ සමාගම ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 06.

***කැබැල්ල : 274.**

ඉඩමේ නම : රෙව්ගොල්ලෙවත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නෝ : බෙලිහුල් ඔය, මුත්තේව්මුවේගම පදිංචි සිරිවර්ධන මුදියන්සේගේ ධම්මවතී, බෙලිහුල් ඔය මුත්තෙට්ඩුවේගම පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ ප්‍රේමවතී ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 19.

***කැබැල්ල : 275.**

ඉඩමේ නම : රෙව්ගොල්ලෙවත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නෝ : බෙලිහුල් ඔය, මුත්තෙට්ටුවේගම පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ ධම්මවතී, බෙලිහුල් ඔය, මුත්තෙට්ටුවේගම පදිංචි සිරිවර්ධන මුදියන්සේලාගේ ප්‍රේමවතී ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 22.

***කැබැල්ල : 276.**

ඉඩමේ නම : රෙව්ගොල්ලෙවත්ත ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නා : බලන්ගොඩ පදිංචි ප්‍රැන්සිස් ලාසරස් ගෝමස් ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 05.

***කැබැල්ල : 301.**

ඉඩමේ නම : මැදආරාවෙවත්තෙ හේනේකුඹුර නොහොත් මැද ඉරාවැල්ල ; විස්තරය : තේ ; අයිතිකම් කියන්නෝ : මුත්තෙට්ටුවේගම පදිංචි රත්නායක මුදියන්සේලාගේ සෙනවිරත්න, මුත්තෙට්ටුවේගම පදිංචි බෝවත්තේ මොහොට්ටාල්ලාගේ කිරි බණ්ඩා ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 00.

තක්සේරු මිල, අක්කරයක් රුපියල් 100කට වැඩි නොවන මුදලක් වේ.

මෙකී ඉඩම් ගැන වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරිතුමාගෙන්ද, ඒ වාගේ සිතියම් කොළඹ සර්වෙයර් ජනරාල් තුමාගෙන්ද ලබාගත හැකි වේ.

ඊ. කේ. ආර්. අසරප්පා,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමා වෙනුවට.

1959 අප්‍රේල් 17 වෙනි දින,
ඉඩම් පිළිබඳ කොමසාරිස්තුමාගේ කාර්‍යාලයේදීය.

* බදුදීමට පමණයි.

---

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

අංකය : ජේ 58/59 ඇල්. ජී. 289 ඇස්. ආර්/ඒ. 18.

### 1954රේ අංක. 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥා පණතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5 වෙනි වගන්තිය යටතේ කරනු ලබන ප්‍රකාශයයි**

මීට යාකොට ඇති උපලේඛනයේ සඳහන් එකිනෙක ඉඩම් පොදු කටයුත්තකට අවශ්‍යව ඇති හෙයින්, එකී ඉඩම් 1954 අංක 39 දරණ ඉඩම් අයත්කර ගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ, 1950 අංක 9 දරණ ඉඩම් අයත්කර ගැනීමේ ආඥාපණතේ 5 (1) වගන්තිය යටතේ අයත්කර ගනු ලබන බව (ඉහතකී ආඥාපණතේ 62 (1) වගන්තියෙන් සංශෝධිත, 1947 අංක 40 දරණ (කොළඹ) විශෙෂ ප්‍රදෙශ සංවර්ධන ආඥාපනතේ 5 වෙනි වගන්තිය සමග කියවා තේරුම් ගත යුතු) එකී ආඥාපණත යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය චාල්ස් පාර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා,

එම් 1959 ක්වූ පෙබරවාරි මස 28 වෙනි දින,
කොළඹදීය.

**උපලේඛනය**

මුල් ප්ලෑනයේ අංක : ඒ 3,457 කොළඹ නාගරික සීමාව තුළ පිහිටි අංක 7 දරණ කොට්ඨාශය. සැන්ට් පෝල්ස්

**කැබැල්ල : 23.**

ඉඩමේ නම : ආදුරුප්පු වීථියේ වරිපනම් අංක 7, 9 හා 11 සහ 11ඒ කොටස ; විස්තරය : මුඩුබිම ; අයිතිකරුගේ නාම : ඒ. විජේවර්ධන මහත්මිය, "නිර්මලා", 34, තර්ස්ටන් පාර, කොළඹ ; ප්‍රමාණය : අ. 0, රූ. 01. පා. 28.

---

ඇල්එච්/ඒ. 814.

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

**5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපනතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ආදායම් පාලක නිලධාරි කොටසේ ගල්තුඩේ නමැති ගමේ පිහිටි කහටගහවත්ත නමැති අ. 1, රූ. 2, ප. 1.93ක් පමණ ප්‍රමාණය ඇති ඉඩම් කට්ටි 3ට මායිම් :—

උතුරට හා නැගෙනහිරට : කරත්ත පාරක් හා මෙම ඉඩමේම කොටසක් ; දකුණට : රජය සතු කළු/වැව්ට රජයේ සිංහල බාලිකා පාසල් වත්ත හා පුල්ලෙපෙරුමගෙවත්ත නොහොත් කහටගහවත්ත නම් ඉඩම ; බටහිරට : ගනේගොඩවත්ත නොහොත් ගලගාවත්ත නම් ඉඩම.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංකය : ජේ. 57 ඊ. 347/ඇල්. එච්./ඒ. 814.

1959 මාර්තු මස 16 වැනි දින,
කොළඹදීය.

---

ඇල්එච්/සී. 2.

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

**5 වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි**

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ ආදායම් පාලක නිලධාරි කොටසේ, පානදුර නගර සභා සීමාව තුළ වෝඩ් නො. 3, එගොඩඋයන ගම්පති වසමේ පට්ටිය උතුර ගමේ පිහිටි අ. 0, රූ. 2, ප. 21ක් පමණ ප්‍රමාණය ඇති දෙඹගහවත්ත නම් ඉඩම් කැබැල්ල.

උතුරට : පානදුරා ගඟ ; නැගෙනහිරට : ආතර් ද සිල්වා අයිතිකම් කියන දෙඹගහවත්ත නම් ඉඩම හා සිමෙන්තියේ තනා ඇති කානුව ; දකුණට හා බටහිරට : ආතර් ද සිල්වා අයිතිකම් කියන දෙඹගහවත්ත නම් ඉඩම.

2. කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුනේ ආදායම් පාලක නිලධාරි කොටසේ, පානදුර නගර සභා සීමාව තුළ වෝඩ් නො. 3, එගොඩ උයන ගම්පති වසමේ, පට්ටිය උතුර ගමේ පිහිටි අ. 0, රූ. 0, ප. 17ක් පමණ ප්‍රමාණය ඇති දෙඹගහවත්ත නම් ඉඩම් කැබැල්ල.

උතුරට : පානදුරා ගඟ ; නැගෙනහිරට : ඔරුවැල්ල පාර ; දකුණට හා බටහිරට : සිමෙන්තියෙන් තනන ලද කානුව.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ57/58 අයි ඇස්171/ඇල්එච්/සී. 2.

1959ක්වූ මාර්තු මස 24 වැනි දින,
කොළඹදීය.

ඇල්එච්/ඒ. 2062.

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥාපනතින් සංශෝධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

කළුතර දිස්ත්‍රික්කයේ රයිගම් කෝරළයේ ආදායම් නිලධාරි කොටසේ කොතලාවල නම් ගමේ පිහිටි අ. 1, රූ. 2, ප. 0 පමණ ප්‍රමාණය ඇති කීනගහහේන නම් ඉඩමට මායිම් :—

උතුරට : කළු/විදගම රජයේ මිශ්‍ර පාසල් වත්ත (රජය සතු) හා විදගම පදිංචි පුල්ලෙපෙරුමගේ විළියම් පෙරේරා හා තවත් අයට අයත් පුවක්හේන නම් ඉඩම ; නැගෙනහිරට : මෙම ඉඩමේම කොටසක් ; දකුණට : රයිගම ටී. මැගිනෝනා අයිතිකම් කියන කීනගහහේන කට්ටිය නම් ඉඩම හා විදගම දෙන් මැනුවෙල් හා දෙන් පීටර් අප්පුහාමි හා තවත් අයට අයත් ඉංගිරියදෙණිය කුඹුර නම් ඉඩම ; බටහිරට : විදගම දෙන් මැනුවෙල්, දෙන් පීටර් අප්පුහාමි හා තවත් අයට අයත් ඉංගිරියදෙනියකුඹුර හා ඔිවිට.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංකය : ජේ 57/58 ඊ 566/ඇල්එච්/ඒ 2062.

1950ක්වූ මාර්තු ඔස 26 වැනි දින,
කොළඹදීය.

---

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තරකර තිබෙන ඉඩම පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 5 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයාවූ චාල්ස් පර්සිවෙල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

මහනුවර දිස්ත්‍රික්කයේ උඩබුලත්ගම ආදායම් කොට්ඨාශයේ නාවලපිටිය ගම්මුලාදෑනි වසමේ බව්වාගම ගමෙහි පිහිටි හයින්පෝඩ් වත්තෙන් ප්‍රමාණයෙන් අක්කර 1, රූඩ් 2, පර්චස් 0ක්වූ පහත මායිම් සඳහන් බිම්කැබැල්ල :—

උතුරට : ගෙදරවත්ත නමැති ඉඩමෙන් කොටසක් ; නැගෙනහිරට සහ දකුණට : හයින්පෝඩ් වත්තෙන් කොටසක් ; බස්නාහිරට : හයිපෝඩ්වත්තෙන් කොටසක් සහ කුඹුර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමති.

අංක : ඇල්. ඡ./ඡ. 17 ජේ. 57/58 ඇස්. 676,

1959 මාර්තු මස 20 වැනි දින,
කොළඹදීය.

---

### 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

5වෙනි වගන්තිය යටතේවූ ප්‍රකාශයයි

මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම් පොදු කටයුත්තකට උවමනා කර තිබෙන බවත් එය ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ විධිවිධාන යටතේ ලබාගන්නා බවත් 1954 රේ අංක 39 දරණ ඉඩම් ලබා ගැනීමේ සංශොධිත ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ (5) වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිවරයා වූ චාර්ල්ස් පර්සිවල් ද සිල්වා නමැති මම මෙයින් ප්‍රකාශ කරමි :

බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදායම් පාලක නිලධාරි කොඨාශයේ මිල්ලබැද්ද ගම තුළ පිහිටි අංක 35 දරණ අවසාන ගම් සිතියමේ එච්. 47 දරණ කැබැල්ලෙන් දක්වෙන බුලුගහහේන නමැති ඉඩමෙන් අඩි 525 ක් දිග හා අඩි 1 ක් පළල බිම් ප්‍රමාණයකට මායිම් පහත දක්වේ :—

උතුරට සහ දකුණට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ එච් 4 දරණ කැබැල්ලෙන් දක්වෙන එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ අයි. 47 දරණ මළකඳුර ; බස්නාහිරට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ ජී. 47 දරණ කැබැල්ල.

2. බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ආදායම් පාලක නිලධාරි කොඨාශයේ මිල්ලබැද්ද ගම තුල පිහිටි අංක 35 දරණ අවසාන ගම් සිතියමේ ජේ. 47 දරණ කැබැල්ලෙන් දක්වෙන බුලුගහහේන නමැති ඉඩමෙන් අඩි 100 ක් දිග හා අඩි 1 ක් පළල බිම් ප්‍රමාණයකට මායිම් පහත දක්වේ :—

උතුරට සහ දකුණට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ ජේ 47 දරණ කැබැල්ලෙන් දක්වෙන එම ඉඩමේම ඉතිරි කොටස ; නැගෙනහිරට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ අංක 161 කේ කැබැල්ල ; බස්නාහිරට : අංක 35 දරණ අවසාන ගම් සිතියමේ අංක අයි 47 දක්වෙන මළකඳුර.

සී. පී. ද සිල්වා,
ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා.

අංක ජේ. 56 ඊ 440.

1959 මාර්තු මස 10 වැනි දින,
කොළඹදීය.

---

අංකය : කිව්.ඒ. 348.

### 1954 රේ අංක 39 දරණ සංශොධිත පනතින් සංශොධනය කළ පරිදි 1950 හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954 රේ අංක 39 දරණ සංශොධිත පනතින් සංශොධනය කළ පරිදි 1950 හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:—

මූලික සිතියම් නො. ඒ. 4,285 ගම මයිපාලගොඩ

**කැබැල්ල 1 :**

ඉඩමේනම : හාලිමුල්ල වත්ත ; විස්තර : අතුසෙවිලිකළ පැලක් සහ ලිංතුනක් ඇති පොල් ඉඩම ; අයිතිකම් කියන අය : පෝල් ඇඩ්වඩ් පීරිස් දෙරනියගල මයා, අංක. 59. කාසල් වීථිය, කොළඹ, 8. ; ප්‍රමාණය : අ. 16, රූ. 0, ප. 15.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටිනා සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 1959 ක්වූ මැයි මස 26 වැනි දින අපරභාග 2.30 වේලාවට කොළඹ, කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1959 ක්වූ මැයි මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

සී. ආර්. ද සිල්වා,
කොළඹ දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ වැඩබලන අතිරේක ඒජන්තතුමා.

වෂ් 1959 ක්වූ අප්‍රියෙල් මස 9 දින,
කොළඹ කච්චේරියේදීය.

---

ඇල්.ඩී./බී. 1

### 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ උඩගම පල්ලේගම ගම් මූලාදෑනි වසමේ වේරගල් ගම්මැද්දේ පිහිටි, පන්විල නයිට්ස්ඩේල් වත්තේ පී. එච්. ගුනසේන මහතා විසින් අයිතිවාසිකම් කියනු ලබන මූලික සිතියම් අංක ඒ. 2592 කැබලි අංක 1 වශයෙන් විස්තර කර ඇති බදුවත්ත නැමති අක්කර 6, රූඩ් 0, පර්චස් 23ක් වූ ඉඩම.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959. 5. 27 වැනි දින පූ. භා. 10.00 ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959. 5. 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියළුම ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1959 ක්වූ අප්‍රේල් මස 7 වැනි දින,
මහනුවර කච්චේරිය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥපනතෙන් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේවූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශොධිත ආඥපනතින් සංශොධනය කරන ලද පරිදි 1950 හේ අඩක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම්දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විත්තර:—

මහනුවර දිස්ත්‍රික්කයේ හාරිස්පත්තුවේ ප්‍රාදේශීය ආදායම් කොට්ඨාශයේ උඩගම්පහ කෝරළේ අලවතුගොඩ ගමෙහි පිහිටි සයිස්ටන් වත්ත නැමැති ප්‍රමාණයෙන් අක්කර 19, රූඩ් 3, පර්චස් 16ක් වූ මූලික සිතියම් අංක ඒ 2593 හි කැබලි අංක 1, 2, 3 සහ 4 යනුවෙන් මැන විස්තර කරණලද දැනට මෙහි පහත නම් සඳහන් අය විසින් අයිති වාසිකම් කියනු ලබන ඉඩම:

කැබලි අංක 1 සහ 3 වෙනුවෙන් අයිතිවාසිකම් කියනු ලබන්නේ:—
අඹතැන්නේ වෙලේකඩේ පදිංචි ඇම්. කේ. ඇස්. හබිබ් මොහමඩ් සහ ඇම්. කේ. ඇස්. ෂාවුල් හමීඩ් විසිනි.

කැබලි අක 2 සහ 4 වෙනුවෙන් අයිතිවාසිකම් කියනු ලබන්නේ:—
අලවතුගොඩ ක්‍රෙග්හිල් වත්තේ පදිංචි එච්. ඇම්. ඉසැඩ්. අබ්දීන් විසිනි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 1959 ජූනි මස 3 වන දින පෙරවරු 9.30ට මහනුවර කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1959 මැයි මස 27 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිත වූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

තවද ඒ ඉඩම සම්බන්ධව ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරුකර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති සියලුම ඔප්පු සහ ලියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වනු ලබන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඊ. ඇම්. ඩී. වික්‍රමසිංහ,
මහනුවර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වෂී 1959 ක්වූ අප්‍රේල් මස 8 දින,
මහනුවර කච්චේරියේදීය.

---

අංක: ජේ 57/58 ඇල් 734 (මී ඊ)-ඇල් ඩී/සී/10.

### සුද්ධියක්

1958 නොවැම්බර් මස 28 වෙනි දින අංක 11,603 දරණ ලංකා ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ 3 වෙනි කොටසේ, "1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ සංශෝධිත ආඥපනතෙන් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත යටතේ ගරු ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ඇමතිතුමා විසින් පළකරන්ට යෙදුන 1958 ඔක්තෝබර් මස 29 වෙනි දින දරන 5 වෙනි වගන්තිය යටතේ වූ ප්‍රකාශයේ පලකර ඇති කොම්පාස් දිසා වෙනුවට පහත සඳහන් පරිදි කොම්පාස් දිසා යොදා නිවරදි කරනු මැනවි.

නැගෙනහිර
දකුණ
බටහිර
උතුර.

---

සඳහන් කළ යුතු අංකය: ඇල්ඒ/ඒ.89.

## 1934රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තතක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

පොදු කටයුත්ත: තෙල්වත්ත දුම්රිය මාර්ගය වැඩි දියුණු කිරීම සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීම.

ඉඩම් හා ඉඩම් සංවර්ධනය පිළිබඳ ගරු ඇමති තුමා විසින් ඔහුගේ 58.1.9 වැනි දින අංක ජේ 57 ඊ 471 දරණ ප්‍රකාශණයෙන් තීරණය කර 58.2.7 වැනි දින අංක 11,255 දරණ රජයේ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පරිදි—

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩම්වල විස්තර:—

ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය: වැල්ලබඩ පත්තුව. ගම් මූලාදෑනි වසම: තෙල්වත්ත. ගම: තෙල්වත්ත. සැලැස්මේ අංකය:

අංක ඒ. 1,705 දරණ මූලික සැලැස්ම.

**කැබැල්ල: 1.**

ඉඩමේ නම: මූදිල්ලගහවත්ත; විස්තරය: පොල් ගස් 5ක් සහ හිරිගල් වලක් ඇතුළත් පොල්වත්ත; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 07.8.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 1959 මැයි මස 26 වැනි දින අ. භා. 3ට ගා/තෙල්වත්ත ආණ්ඩුවේ මිශ්‍ර පාඨශාලාවේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959 මැයි 19 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලු හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

අයිතිවාසිකම් සථිර කිරීමට අදාළවන ඔප්පු, ලියකියවිලි ආදිය විභාගය පවත්වන වේලාවේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.
අංක ඒ 1,705 දරණ මූලික සැලැස්මේ පිටපතක් තෙල්වත්ත ගම් මුලාදෑනි මහතාගේ කායඹාලයේ බැලීම සඳහා තැන්පත් කර ඇත.

ජේ. ජේ. ජී. අමිර්තනායගම්,
ගාලු දිස්ත්‍රික්කයේ ඉඩම් රජයට ගැනීමේ නිලධාරිතැන.

1959 අප්‍රේල් මස 7 වැනි දින,
ගාල්ලේ කච්චේරිය.

---

සඳහන්කළයුතු අංකය. ඇල් ඒ/ඒ. 90.

## 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපණතින් සංශොධිත වූ 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපනත

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අඩක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥපනතින් සංශොධිත වූ, 1950හේ අඩක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ඉඩමේ නම: රත්මහරවත්ත; විස්තරය: අවුරුද්දක් වයසැති අතුරු පොල් පැළ වගාවක් ඇති අවුරුදු 15 සිට 35 දක්වා වයසැති පොල් ඉඩම; අයිතිවාසිකම් කියන්නා: ඇල්. ජයතිලක මහත්මිය, දියුලපිටිය; ප්‍රමාණය: අ. 6, රූ. 1, ප. 30.3.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 ජූනි මස 15 දින පූ. භා. 10 වේලාවට කුරුණෑගල කච්චේරියේදී මා සම්මුඛවිය යුතුයි.

තවද 1959 ජූනි මස 8 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත (පිටපත් දෙකක් සහිතවූ) ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඉඩමට අයිතිවාසිකම් කියන අයවලුන් විසින් එහි අයිතිය සම්බන්ධව ඇති ඔප්පු විභාගයේදී මා වෙත ඉදිරිපත් කළ යුතුයි.

කේ. වී. ඇස්. කදිර්ගාමනාදන්,
කුරුණෑගල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ
උප ඒජන්තතුමා.

වර්ෂ 1959ක්වූ අප්‍රේල් මස 8 දින,
කුරුණෑගල කච්චේරියේදීය.

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් ලබාගැනීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ලබාගැනීමට අදහස් කර ඇති ඉඩමේ විස්තර: මැදවච්චිය ගමේ ඇෆ්. වී. පී. 113 දරණ ප්ලෑනේ 1 වැනි අතිරේකය

**ලොට් අංකය: 61.**

ඉඩමේ නම: මැදවච්චිය කැලේ; ඉඩමේ විස්තර: අවු. 1ක් වයස කෙසෙල් පඳුර, අවු. 7ක් වයස මුරුන්ගා ගස් 7ක් සහ 1 පොල් ගසක්ද වේ, වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: මැදවච්චියේ ආර්. ජී. ගුණවර්ධන, බදු බලපත්‍ර අංක 7. ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 5.1.

**ලොට් අංකය: 62.**

ඉඩමේ නම: මැදවච්චිය කැලේ; විස්තර: මුඩුබිම; හිමිකම් කියන්නාගේ නම: ඒ. අබ්දුල් මජීදු, මැදවච්චිය. බදු බලපත්‍ර අංක 120. ප්‍රමාණය: අ. 0, රූ. 2, ප. 9.3.

**ලොට් අංකය: 63**

ඉඩමේ නම: මැදවච්චිය කැලේ; විස්තර: දෙහිගස් 2යි, අවු. 8ක් වයස, අවු. 5ක් වයස දෙළුම් ගස් 3යි. දෙළුන් ගස් 1යි. අවු. 6ක් වයසැති ස්ථිර වැසිකිළි 1යි, එළුවන් බඳින ගාල් 2යි, වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: මැදවච්චියේ ඇල්. ආරුමුගම්, බදු බලපත්‍ර අංක 328; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 22.7.

**ලොට් අංකය: 64.**

ඉඩමේ නම: මැදවච්චිය කැලේ; විස්තර: මුඩුබිම; හිමිකම් කියන්නාගේ නම: මැදවච්චියේ ආර්. ජී. ගුණවර්ධන, බදු බලපත්‍ර අංක 123; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.2.

**ලොට් අංකය: 65.**

ඉඩමේ නම: මැදවච්චිය කැලේ; විස්තර: කොහොඹගස් දෙකයි අවු. 5ක් පමණ වූ දෙහි ගස් දෙකද ඇති වත්ත; හිමිකම් කියන්නාගේ නම: ඇල්. ආරුමුගම්, මැදවච්චිය, බදු බලපත්‍ර අංක 428 ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 5.5.

**ලොට් අංක: 67.**

ඉඩමේ නම: මැදවච්චි කැලේ; විස්තර: මුඩු බිම; හිමිකම් කියන්නාගේ නම: ඊ. මුත්තුසාමි, මැදවච්චිය, බදු බලපත්‍ර අංක 123; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 5.2.

**ලොට් අංක: 70.**

ඉඩමේ නම: කුඹුක්ගහඉඩම; විස්තර: තල් ගස් 12යි, අවු. 3යි, කෙසෙල් පඳුරු 25යි, බිලිං ගස් 1යි, අවු. 1යි, බෙලි ගස් 1යි, කොහොඹගස් 1යි, දෙහි ගස් 4යි, දෙළුම් ගස් 3යි, පේරගස් 9යි, අවු. 1-3 වයසයි, අඹගස් 6යි, කොස් ගස් 5යි, පුවක් ගස් 22යි, අවු. 10ක් පමණ වූ පොල් ගස් 19යි, අවු. 15ක් පමණ වයස් වූ දෙඩම් ගස් 4යි, අවු. 4ක් වයස්වූ සහ මැටි ගෙයක් ද ගාලක් ද ඇති වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: ඊ. මුත්තිසාමි, මැදවච්චිය, බදු බලපත්‍ර අංකය 123. ඒ. මීරා මෝහිදීන්, මැදවච්චිය, බදු බලපත්‍ර අංක 20/113; ප්‍රමාණය: අ. 1, රූ. 0, ප. 18.

**ලොට් අංක: 74.**

ඉඩමේ නම: සේගුනම්බි අක්කරයේන; විස්තර: වතු ඉඩම සහ කුඹුරු ඉඩම, ඇස්බැස්ටෝස් සෙවිලි කළ ලී ගබඩාවක්, පොල් අතු ගෙවල් 2යි, මැටි ගෙයක කොටසක් සහ කඩයක් ද වැසිකිළිය සහ කටු කම්බි ගැසූ වැට; හිමිකම් කියන්නාගේ නම: ඒ. ඇස්. අලිබ්‍රාම් සයිබු, ඒ. ඇස්. කාදර්මීරා සයිබු සහ ඒ. ඇස්. මොහොමඩ් සිඩ්ඩි, මැදවච්චිය; ප්‍රමාණය: අ. 5, රූ. 3, ප. 10.8.

**ලොට් අංක: 75.**

ඉඩමේ නම: මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම; විස්තර: වතු ඉඩම සහ මැටි කඩයක් උළු වහල සහිත; හිමිකම් කියන්නාගේ නම: ඒ. අන්නම්මා, පොසින්ට් පේදුරු; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 7.2.

**ලොට් අංක: 76.**

ඉඩමේ නම: මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම; විස්තර: තල් ගස් 2යි, අවු. 10ක් පමණ වයසැති, උළු සෙවිලි කරන ලද සහ මැටි ගෙයක් ඇති වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: ඒ. පරු වතිපිල්ලේ, මැදවච්චිය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 9.5.

**ලොට් අංක: 77.**

ඉඩමේ නම: මැදවච්චිය කඩේ, මැදවච්චිය කඩේ නිලම; විස්තර: මුඩු බිම; හිමිකම් කියන්නාගේ නම: ආර්. ජී. රොසලින් නෝනා, ආර්. ජී. ගුණවර්ධන, ආර්. ජී. සිරිවර්ධන සහ එච්. ජී. පී. ජිනදාස, මැදවච්චිය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 4.7.

**ලොට් අංක: 78.**

ඉඩමේ නම: මැදවච්චිය කඩේ; විස්තර: අවු. 2ක් වයසැති පොල් ගස් 1යි, කෙසෙල් ගස් 4යි, පැපොල් ගස් 1යි, අවු. 1 වයසැති සහ මැටියෙන් තනන ලද ගලගාල් 2යි, වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: ඇස්. වන්නියාගම් පිල්ලේ සහ කේ. නඩරාජා, මැදවච්චිය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 8.7.

**ලොට් අංක: 79.**

ඉඩමේ නම: මැදවච්චිය කඩේ; විස්තර: අවු. 5ක් වයසැති දෙහි ගස් එකයි, අවු. 15 වයසැති තල් ගස් 1යි, මැටියෙන් කරන ලද පදිංචි ගෙවල් එකයි, යන මේවා ඇති වතු ඉඩම; හිමිකම් කියන්නාගේ නම: කේ. මොහොම්මදු මීරා සයිබු, මැදවච්චිය; ප්‍රමාණය: අ. 0, රූ. 0, ප. 10.3.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවළුන් හෝ 1959 මැයි මස 26 වෙනි දින පෙරවරු 10ට මැදවච්චිය තානායමේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 1959 මැයි මස 19 වෙනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ඇල්. ගුණසේකර,
අනුරාධපුර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා වෙනුවට.

1959 අප්‍රේල් මස 8 වෙනි දින,
අනුරාධපුර දිසාපති කාර්‍යාලයයේ දී ය.

---

ඇල්ඒ. 110.

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධනය කරන ලද පරිදි 1950හේ අංක 9 දරන ඉඩම් ලබාගැනීමේ ආඥාපනත

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිතවූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

550හේ ගම් සිතියමට උඩෘත අංක 2—ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, සප්කිඳ ප්‍රාදෙශීය ආදායම් පාලක නිලධාරි කොට්ඨාශය, පස්සර කෝරළය, කණවරැල්ල ගම්මුලාදෑනි කොටස, කණවරැල්ල ගම

කැබැලි අංකය : 326.

ඉඩමේ නාම : බුලුගොල්ලකුඹුර ; විස්තරය : පරණ කුඹුර ; හිමිකම් කියන අය : ඩී. ඇම්. බණ්ඩාරමැණිකා සහ ඩී. ඇම්. පුංචිමහත්මයා, කණවරැල්ල, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. ලොකුමැණිකා, උඩවත්තෙකඩේ, කණවරැල්ල, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. හීන්මැණිකා, කැලේහේන, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. කුමාරිහාමි, නො. 23, කොළනිය, උහන ; ඩී. ඇම්. කළුමැණිකා, ඉඩමේගෙදර, වැල්ගොල්ල, දෙමෝදර ; බිම් ප්‍රමාණය : අ. 1, රූ. 0, ප. 2.

කැබලි අංකය : 328.

ඉඩමේ නාම : කුඩාගල්හින්න අම්පිටිහේන ; විස්තර : හේන : හිමිකම් කියන අය : ඩී. ඇම්. බණ්ඩාරමැණිකා සහ ඩී. ඇම්. පුංචි මහත්මයා, කණවරැල්ල, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. ලොකුමැණිකා, උඩවත්තෙකඩේ, කණවරැල්ල, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. හීන් මැණිකා, කැලේහේන, මාඋස්සගොල්ල ; ඩී. ඇම්. කුමාරිහාමි, නො. 23, කොළනිය, උහන ; ඩී. ඇම්. කළුමැණිකා, ඉඩමේගෙදර, වැල්ගොල්ල, දෙමෝදර ; බිම් ප්‍රමාණය : අ. 0, රූ. 3, ප. 23.8. එකතුව : අ. 1, රූ. 3, ප. 25.8.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1959 මැයි මස 29 වැනි දින උදේ 10ට බදුල්ල කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1959 මැයි මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඇන්. ඩී. ජයවීර,
බදුල්ල දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1959 අප්‍රේල් 6 වැනි දින,
බදුල්ල කච්චේරිය.

---

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## වවුනියා දිස්ත්‍රික්කය. 2125 දරන "ඒ" මුල් ප්ලෑන ; ඕමන්තායි. පැට්‍රෝල් හා භූමිතෙල් විකුණන ස්ථානයක් පිහිටුවීම සඳහා අංක 2 දරන ඉඩම් කට්ටියේ බද්ද වෙන්දේසි කිරීම

වවුනියා දිස්ත්‍රික්කයේ දකුණු වවුනියා ප්‍රාදේශික ආදායම් නිලධාරි (දෙමළ) කොට්ඨාශයේ ඉරම්බයිකුලම්හි වවුනියා-යාපනේ පාරේ 120 වන සැතපුම් කණුව අසල පිහිටි රූඩ් 2ක් විශාල වූ 2125 දරන "ඒ" මුල් ප්ලෑනේ 2 වන ඉඩම් කට්ටියේ බද්ද 1959 අප්‍රේල් මස 30 වන දින පෙරවරු 10ට ඕමන්තායි දිස්පැන්සරියේදී වවුනියා දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත (මින්පසු ආණ්ඩුවේ ඒජන්ත යැයි සඳහන් කෙරෙනු ඇත) විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බවට මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. 1948 අංක 18 දරන පුරවැසි පනතින් අර්ථ නිරූපණය කර ඇති පරිදි ලංකාවේ පුරවැසියන්ට පමණක් මෙම විකිණීම සීමා කෙරෙන්නේ ය.

3. ලන්සු තැබීම නියමිත මුදල උඩ ආරම්භ කළ යුතුය. මුල් ලන්සුව වන නියමිත මුදල වූ රු. 2,000ට අඩු වූ ලන්සුවක් නො පිළිගනු ලැබේ.

4. යම් ලන්සුවක් පිළිගැනීමට පෙර එම ලන්සුව තබන අයගේ නිර්ව්‍යාජත්වය පිළිබඳවත් බද්දේ කොන්දේසි පිළිපැදීමට ඔහුට ඇති පුළුවන්කම පිළිබඳවත් තමා සෑහීමට පත් වන පරිදි ආණ්ඩුවේ ඒජන්ත විසින් ඒ පිළිබඳව වග විභාග කළ හැකිය. ඔහු එසේ සෑහීමට පත් නොවුව හොත් එම ලන්සුව නොපිළිගෙන එවැනි ලන්සුවක් නො තැබුවාක් මෙන් සලකා වෙන්දේසිය පවත්වා ගෙන ගිය හැක.

5. ලන්සු තබන සෑම අයකුම පූර්වෝක්ත ස්ථානයට එම වේලාවට තමාම පැමිණ සිටිය යුතුය. නැතහොත්, නිසියාකාරයෙන් බලය පවරනු ලැබූ නියෝජිතයකු එවිය යුතුය. එසේ පැමිණෙන නියෝජිතයින් විසින් තමන්ගේ පත් කිරීමේ ලිපි, පරීක්ෂා කර බැලීම සඳහා වෙන්දේසියට පෙර ඉදිරිපත් කළ යුතුය.

6. විකුණුනු අවසාන ලන්සුව තැබූ තැනැත්තා—

(අ) සිය ලන්සුව පිළිගනු ලැබූ වහාම තමා ලන්සු තැබූ මුදල ද, අත්තිකාරම් වශයෙන් ගෙවන පළමුවන අවුරුද්දේ බදු කුලිය ද වහාම ආණ්ඩුවේ ඒජන්තට ගෙවිය යුතුය.

(ආ) අත්සන් කිරීම සඳහා ඉදිරිපත් කළ බහු පාක්ෂික බදු ඔප්පුව ලැබී දින දහතරක් ඇතුළත එම බදු ඔප්පුව අත්සන් කළ යුතුය.

ඉහත සඳහන් වන (අ) සහ (ආ) දරන ඡේදයන් අනුව ක්‍රියා කිරීමට විකුණුනු අවසාන ලන්සුව තැබූ අය අපොහොසත් වුවහොත්, එම වෙන්දේසිය අවලංගු කොට, එම අය විසින් ගෙවන ලද යම් මුදලක් වේනොත් එය රාජ සන්තක කරන්නට ආණ්ඩුවේ ඒජන්තට පිළිවන.

7. වෙනත් කොන්දේසි අතර, මතු දැක්වෙන කොන්දේසි ද බද්දට ඇතුළත් වෙනු ඇත :—

(අ) කාලය : අවුරුදු 20යි ;

(ආ) කුලිය : අවුරුද්දට රු. 80 යි ;

(ඇ) ආණ්ඩුවේ ඒජන්ත විසින් කලින් අනුමත කර ඇති සැලසුම් හා ගණන් මිනුම් අනුව, පැට්‍රෝල් හා භූමිතෙල් විකුණන ස්ථානයකට අවශ්‍ය ගොඩනැගිලි හා ඉදි කිරීම්, බද්ද පටන්ගෙන අවුරුද්දක් ඇතුළත බදුගැනුම්කරු විසින් පිහිටුවා නිම කළ යුතුය. ආණ්ඩුවේ ඒජන්තගෙන් කලින් ලියවිල්ලකින් අවසර ලබාගෙන මිස, එම ගොඩනැගිල්ලට අතිරේක වශයෙන් තවත් ගොඩනැගිලි තැනීම හෝ ඒවා වැඩි දියුණු කිරීම හෝ බදු ගැනුම්කරු නොකළ යුතුය.

(ඈ) බදුගැනුම්කරු ආණ්ඩුවේ ඒජන්තගෙන් කලින් ලියවිල්ලකින් අනුමතිය ලබාගෙන විනා, එම ඉඩම පැට්‍රෝල් හා භූමිතෙල් විකුණන ස්ථානයක් වශයෙන් මිස වෙන කරුණක් සඳහා නොයෙදිය යුතුය.

(ඉ) බදු දීමනාකරු වෙනුවෙන් ඉඩම් කොමසාරිස්ගේ අනුමතිය ලියවිල්ලකින් ලබාගෙන මිස බදුගැනුම්කරු විසින් බද්ද පිළිබඳ වූ තමාගේ අයිතිවාසිකම සම්බන්ධයෙන් අතුරු බදු දීමක් හෝ සින්නක්කර විකිණීමක් හෝ තෑගි දීමක් හෝ පැවරීමක් හෝ උකස් කිරීමක් හෝ අන් අයුරකින් ඉවත් කිරීමක් හෝ යම් ගනුදෙනුවක් හෝ නොකළ යුතුය.

(ඊ) ඉඩම හා එහි ඇති ගොඩනැගිලි පිළිබඳ සියලුම වරිපණම්, බදු, තක්සේරු බදු හා වෙනත් වියදම් බදුගැනුම්කරු විසින් ගෙවිය යුතුය.

(උ) බදු කාලය ගෙවීයාමෙන් පසු හෝ ඊට කලින් බද්ද අවසන් කිරීමෙන් පසු හෝ බදු ගැනුම්කරු ඉඩමේ නිරවුල් භුක්තිය ආණ්ඩුවේ ඒජන්තට හෝ ආණ්ඩුවේ ඒජන්ත විසින් නිසියාකාරයෙන් බල පවරනු ලැබූ නිලධාරියකුට හෝ බාර දිය යුතුය. එතකුදු වුවත්, ඉඩමට නොනිසි අලාබයක් නොකර, ඉඩමේ ඇති යම් යම් ගොඩනැගිලි කඩා දමා ඒවායේ ද්‍රව්‍ය තමා සතු කර ගැනීමට බදුගැනුම්කරුට හිමිකම ඇත්තේ ය.

(ඌ) ඉඩමේ ඉතිරි වී ඇති යම් යම් ගොඩනැගිලි වෙනුවෙන් හෝ වෙන යම් කවර කරුණක් වෙනුවෙන් හෝ වන්දියක් ආණ්ඩුව විසින් නො ගෙවනු ලැබේ.

8. බද්ද පිළිබඳ වැඩිපුර විස්තර ලබාගැනීම සඳහා ආණ්ඩුවේ ඒජන්තගෙන් ඉල්ලුම්කර සිටිය යුතුය.

ඩී. රාජරත්නම්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවටය.

1959 මාර්තු 19 වැනි දින,
වවුනියා කච්චේරියේදීය.

---

## විශේෂ නිවේදනයයි

1959 මැයි 1 වැනි සිකුරාද ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1959 අප්‍රේල් 30 වැනි බ්‍රහස්පතින්ද නිකුත් කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවන සියළුම දැන්වීම් සහ නිවේදන, 1959 අප්‍රේල් 27 වැනි සඳුද පස්වරු 4ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්ට සැලැස්විය යුතු බව කාගේත් දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

1959 අප්‍රේල් 9 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී